JOURNAL OF MULTIDISCIPLINARY & TRANSLATIONAL RESEARCH

**Journal of Multidisciplinary and Translational Research (JMTR)**

journal homepage: https://journals.kln.ac.lk/jmtr/

# දෙමළ ක්‍රියා මූල වර්ගීකරණය හා අතීතකාල ක්‍රියා පද සාධනය පිළිබඳ අධ්‍යයනයක්

උඩගලදෙණියේ ධම්මවිමල හිමි[1]*

*[1]වාග්විද්‍යා අධ්‍යයන අංශය, මානවශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය, ශ්‍රී ලංකාව*

**සාරසංක්ෂේපය**

සිංහල කථාකරන ජනයා බහුතරයක් වෙසෙන ලංකාව තුළ, දෙමළ මාතෘ භාෂාව කොටගත් පිරිසක්ද දැකගත හැකිය. එමෙන්ම වර්තමාන ලෝකයෙහි ව්‍යාප්ත වී ඇති භාෂා අතර දෙමළ භාෂාවට ප්‍රධාන තැනක් හිමිව ඇති බව දැනට ලෝකයෙහි බහුලව ව්‍යවහාර කෙරෙන භාෂා තිහ අතරට දෙමළ භාෂාව ඇතුළත්ව තිබීමෙන්ද පැහැදිලි වෙයි. පසුගිය දශක කිහිපය තුළ ශ්‍රී ලංකාව තුළ උද්ගතව තිබූ ජනවාර්ගික අර්බුදය කෙරෙහිද 'භාෂාව නොදැනීම' යන කාරණය ප්‍රධාන සාධකය බවට පත්ව තිබූ බව අමුතුවෙන් සඳහන් කළ යුතු නැත. ඒ කෙසේවුවද වර්තමානයේදී ශ්‍රී ලංකාව තුළ සිංහල මාතෘ භාෂකයා දෙමළ බසත්, දෙමළ මාතෘ භාෂකයා සිංහල බසත් ඉගෙනීමට පෙළඹී ඇත. මෙම අධ්‍යයනයේදී සිංහල මාතෘ භාෂකයා දෙවන බසක් ලෙස දෙමළ ඉගෙනීම සම්බන්ධයෙන් සාකච්ඡාවට ලක් කෙරේ. සිංහල මාතෘ භාෂකයා දෙමළ භාෂාව, දෙවන බස ලෙස ඉගෙනීමට වයස් භේදයකින් තොරව උත්සාහ කරන බව පෙනේ. එය අපේ රටේ අනාගත ජාතික සමගියේ අත්තිවාරම බව සුපැහැදිලිය. දෙවන බසක් ලෙස දෙමළ භාෂාධ්‍යනයේදී එය පහසුවෙන් ග්‍රහණය කර ගනු වස් ව්‍යාකරණ ඥානයෙන් ලබාදෙන්නේ නොමඳ පිටිවහලකි. දෙමළ භාෂාවේ ව්‍යාකරණ අංග සමූහයකට ප්‍රධාන වන පිණිසාර්ථ ක්‍රියා රූපය ඉතාමත් වැදගත් ක්‍රියාරූපයකි. එයට හේතුව නම් එය දෙමළ භාෂාවේ බොහෝ ක්‍රියාරූප සාධනයට බෙහෙවින්ම උපකාරීවීමයි. එබැවින් මෙම අධ්‍යයනයේදී අරමුණ වන්නේ එම ක්‍රියා රූප සාධනය සිද්ධ වන ආකාරය පැහැදිලි කිරීමයි. එමනිසා මෙහිදී ක්‍රියා මූලයේ රූපීය ලක්ෂණය පදනම් කරගෙන දෙවන භාෂාවක් ලෙස දෙමළ භාෂාව ඉගැන්වීමේදී ක්‍රියා පද භාවිතය, ඉගැන්වීමේ ක්‍රමවේද කෙසේ සකස් කළ යුතුද? යන්න පර්යේෂණ ගැටලුවයි. වර්තමානයේදී අධ්‍යාපන ක්‍රියාවලිය සම්බන්ධයෙන් මතුව ඇති දහසක් ගැටලුකාරී ස්වභාවයන් හමුවේ දෙවන බසක් ලෙස දෙමළ හදාරන ශිෂ්‍යයනට එය යම් ආකාරයක ගැටලු සහගත බවක් ඇතිකරවන බව පෙනේ. එම නිසා අහඹු ලෙස තෝරාගත් දෙමළ ක්‍රියා මූල 100ක රූපීය ලක්ෂණ පදනම් කොටගෙන අධ්‍යයන කාර්යයෙහිලා පහසු වන අන්දමට එකී ක්‍රියා මූල වර්ගීකරණය කොට අතීතකාල ක්‍රියා රූප සාධනය කවරාකාරව සිදුකළ යුතුද යන්න මෙහිදී සොයා බැලේ.

**මුඛ්‍ය පද:** අතීත කාලයල ක්‍රියාමූලය, දෙමළ භාෂාව, දෙවන බස, පිණිසාර්ථ ක්‍රියා රූපය, සිංහල මාධ්‍ය ශිෂ්‍යයන්

Article info

Article history:
Received 25th February 2023
Received in revised form 30th March 2023
Accepted 29th May 2023
Available online 30th June 2023

ISSN (E-Copy): ISSN 3051-5262
ISSN (Hard copy): ISSN 3051-5602
Doi:

ORCID iD: https://orcid.org/0009-0002-5916-4256
*Corresponding author:
E-mail address: dhammawimala@kln.ac.lk (උඩගලදෙණියේ ධම්මවිමල හිමි)

© 2024 JMTR, CC BY-NC-SA

## හැඳින්වීම

භාෂාව, මානව සත්වයා නෛසර්ගිකව ලැබූ උසස්ම දායාදය බව අවිවාදාත්මක කාරණයකි. මානව සංහතියේ සුසංවර්ධනයෙහිලා භාෂාව ඉටුකරන කාර්යභාරය අන්කිසිවකට සමකළ නොහැකිය. එමනිසා සාමාජික ක්‍රියාවලියේදී අතිශයින්ම වැදගත් වන සාධකය වන්නේ භාෂාවයි. මානව සංස්කෘතියේ තිරසාර පැවැත්මද භාෂාව ලෙස හඳුන්වා දිය හැකි වන්නේ එම නිසාය. සාමාජික ක්‍රියාවලිය පුළුල්වත්ම මානව අවශ්‍යතා වැඩිවීම ස්වාභාවිකය. මානව අවශ්‍යතා වැඩිවීම පදනම්ව මාතෘ භාෂාවට අමතරව දෙවන භාෂාවක අවශ්‍යතාව ඇතිවිය හැකිය. ඒ සමාජයෙන් සමාජය, රටින් රට මුහුවීම සඳහාය. ඒ හරහා මුළු ලොවම වර්තමානය වන විට විශ්ව ගම්මානයක් බවට පත්ව ඇත. මේ හේතුවෙන් සමස්ත ජනවර්ගයාම දැනුවත්ව හෝ නොදැනුවත්ව විවිධ සංස්කෘතීන් හා සංස්පර්ශව (Contact) ක්‍රියා කෙරෙති. සමහරෙක් ස්වකීය පෞද්ගලික අරමුණු පෙරදැරිව ක්‍රියාකරන අතර සමහරෙක් පොදු අවශ්‍යතා මූලිකව ක්‍රියා කෙරෙති (කරුණාතිලක, 2006).

ද්‍රාවිඩ භාෂා පවුලට හා තත් භාෂාවන්ට ඇත්තේ දීර්ඝ වූ ඉතිහාසයකි. නූතනයේ ව්‍යවහාර කරනු ලබන භාෂා හා උපභාෂා හැත්තෑවකට ආසන්න ප්‍රමාණයක් මෙම භාෂා පවුල නියෝජනය කරයි. දෙමළ, මලයාලම්, කණ්ණඩා, තෙළිඟු, තුලු හා කොඩගු වැනි භාෂාවන්ගේ මාතෘ භාෂාව ද්‍රවිඩ භාෂාවයි (කරුණාතිලක, 2015). ද්‍රවිඩ, දමිඩ, දමිළ, තමිල්, දෙමළ යන විවිධ වචනවලින් මෙම බස හැඳින්වේ. වියතුන්ගේ නිර්වචනයට අනුව දමිළ යන වචනයෙහි තේරුම 'අමාව' හෙවත් 'මිහිර' යන්නයි. තත් දමිළ ශබ්දයාගේ අර්ථය අනුව ඔවුන්ගේ අදහස එසේ වුවද දෙමළ භාෂාව කෙරෙන් මධුර හෝ කර්ණරසායන බවක් ජනිත වන්නේ ද යන්න ඇතැමුන්ට ගැටලුවක්ව පවතී (තිලකරත්න, 1990).

ද්‍රවිඩ භාෂාමය ව්‍යවහාර, සංවාද ඇසෙන විට ඉන් රළු, කර්කශ, කඨෝර, අප්‍රසන්න, අමිහිරි ස්වභාවයක් ඇතැයි දෙමළ මාතෘ භාෂකයන් නොවන අයට හැඟෙන කාරණයකි. මූර්ධජ ශබ්දිම බහුල වූ දෙමළ ශබ්දෝච්චාරණ ස්වරූපය පදනම්කොටගෙන එවන් අදහසක් සාමාන්‍ය ලෝකයා තුළ ඇතිවීම බලාපොරොත්තු විය යුත්තකි. දෙමළ භාෂාව පිළිබඳ යථෝක්ත කඨෝරාර්ථය, අදහස සමාජගතවීම තුළ මෙම භාෂාව පඨන, පාඨන, උද්ග්‍රහණ කාර්යයෙහි බොහෝ දෙනා මන්දෝත්සාහී වීමට හේතුවක් කරගනිති. මෙම භාෂාව මනා ලෙස හැදෑරීමේදී පෙනීයන විශේෂ කරුණ නම් දෙමළ භාෂාව හා සාහිත්‍යය දිව්‍යමය ඕජාවක්, අමාවක්, සුධාවක් හෝ අමෘතයක්ම බවයි (පුංචිහේවා, 2011). දෙමළ භාෂාව මාධ්‍ය කොටගත් සුවිසල් මෙන්ම ඉතා උසස් සාහිත්‍යයක් පවතී. තදනුගත සංස්කෘතිය භාෂාවේ සජීවිත්වය ඔපමට්ටම් කරන්නකි. භාෂා හා සාහිත්‍යාධ්‍යයනය තුළින් එකී කාරණය තවදුරටත් සාක්ෂාත්කර ගත හැකිය.

දෙමළ භාෂාව, භාෂාවක් ලෙස ලෝක ව්‍යාප්තියට පත්වී තිබීමට අමතරව, ලාංකිකයනට එය වැදගත් වනුයේ අපේ දේශයේ රාජ්‍ය භාෂාවක් වශයෙන් එකී භාෂාව භාවිත කිරීමයි. ජන කොට්ඨාස කිහිපයක් ජීවත්වන ලංකාව තුළ වර්තමානය වනවිට දෙවන භාෂා ඉගැන්වීම හා ඉගෙනගැනීම යන කාරණද්වය පිළිබඳ පුළුල් සාකච්ඡාවක් ගොඩනැඟී ඇති බව පෙනේ. රාජ්‍ය මට්ටමෙන් ඒ සඳහා නොයෙක් අණපණනත් සකස් කෙරෙමින් පවතී. එයම භාෂා ඉගැන්වීම හා ඉගෙනගැනීම සඳහා ප්‍රමාණවත් නොවන අතර, දෙවන බසක් ඉගැන්වීම සඳහා නව ක්‍රමවේදයන් හඳුන්වා දීමට යුහුසුලුව ක්‍රියා කළ යුතුව ඇත.

සිංහල මාතෘ භාෂකයා දෙවන බසක් ලෙස දෙමළ බස හැදෑරීමේදී මුහුණපාන ගැටලු අතර ක්‍රියා පදයෙහි භාවිතය කෙබඳු ආකාර විය යුතුද යන්න යම් තරමක ගැටලු සහගත තත්වයකට පත්ව සිටින බව දකගත හැකිය. එයට හේතුව සාම්ප්‍රදායික දෙමළ ව්‍යාකරණය තුළ ක්‍රියා පදය ප්‍රබල ක්‍රියා හා දුබල ක්‍රියා යනුවෙන් වර්ගීකරණය කර තිබීමයි. මෙසේ වර්ගීකරණය කිරීමට පදනම් වූ කාරණය ගැන පැහැදිලි විස්තර කිරීමක් දැකගත නොහැකිය. එහෙයින් සිංහල මාතෘ භාෂාව කරගත් භාෂකයා දෙවන බසක් ලෙස දෙමළ ඉගෙනගැනීමේදී යම් අසීරුතාවකට ලක්වීම ස්වාභාවිකය. කරුණු එසේ වුවද දෙමළ ක්‍රියා පදය ඉගැන්වීම හා එහි භාවිතය කෙරෙහි ව්‍යවහාරික වාග්විද්‍යා සිද්ධාන්තයනට අනුව නව ක්‍රමවේදයක් මෙහිදී සොයාබැලේ.

## දෙමළ බස ඉගෙනීමේදී මුහුණුපාන භාෂාත්මක ගැටලු

සිංහල හා දෙමළ භාෂා සංස්ථික වශයෙන් වෙනස් වන නිසාම දෙවන බසක් ලෙස දෙමළ ඉගෙන ගැනීමේදී සිංහල මාතෘ භාෂකයා භාෂාත්මක වශයෙන් ගැටලු රාශියකට මුහුණ දෙයි. ඒ අතර,

- ❖ භාෂා සංස්ථිතිය (Structure of Language) හා
- ❖ භාෂා ද්විරූපතා ලක්ෂණ (Diglossic Features) ප්‍රධාන වෙයි.

වාග්විද්‍යාත්මකව භාෂා සංස්ථිතිය යන්නෙන් අදහස් කරනුයේ,

- ❖ ශබ්ද පද්ධතිය - Phonetic System
- ❖ ශබ්දිම පද්ධතිය - Phonemic System
- ❖ පදිම පද්ධතිය - Morphological System
- ❖ වාක්‍ය පද්ධතිය - Syntactic System
- ❖ අර්ථ පද්ධතිය - Semantic System (කරුණාතිලක, 2006)

## ශබ්දිම පද්ධතිය ආශ්‍රිත මතුවන ගැටලු

## ලේඛන සිංහල හෝඩිය

## ස්වර - Vowels

සිංහල භාෂාවේ ස්වරාක්ෂර 18කි. දෙමළ භාෂාවේ 12කි.
සිංහල ශබ්දිම හෝඩියේ හමුවන ඇ ඈ ස්වර ශබ්දිම දෙමළ ශබ්දිම හෝඩියේ හමු නොවේ.

## ව්‍යඤ්ජන - Consonants

සිංහල භාෂාවේ ව්‍යඤ්ජනාක්ෂර 42 කි. දෙමළ භාෂාවේ ව්‍යඤ්ජනාක්ෂර 30කි.
සිංහල ව්‍යඤ්ජන ශබ්දිම අතර ක/k/ ච/c/ ට/ṭ/ ත /t/ ප/p/ ග /g/ ජ/ɟ/ ඩ/ḍ/ ද/d/ බ/b/ තනි ශබ්දිම වේ.

## පදිම හා වාක්‍ය පද්ධතිය ආශ්‍රිතව මතුවන ගැටලු

දෙවන බසක් ලෙස දෙමළ භාෂාව ඉගෙන ගන්නා සිංහල මාතෘ භාෂකයා මව් භාෂකයාට පදිම හා වාක්‍ය පද්ධතිය සම්බන්ධයෙන්,

- ❖ විභක්ති භේදය - Case
- ❖ ලිංග භේදය - Gender
- ❖ කාල භේදය - Tenses

යන කොටස් සම්බන්ධයෙන් ගැටලු හඳුනාගත හැකිය.

## විභක්ති භේදය සම්බන්ධව මතුවන ගැටලු කිහිපයක්

**වගුව 1:** විභක්ති භේදය සම්බන්ධව මතුවන ගැටලු කිහිපයක් (ධම්මවිමල, 2019).


| සිංහල | දෙමළ |
|---|---|
| මම දන්නවා | எனக்குத் தெரியும் |
| අම්මා මට බැන්නා | அம்மா என்னை ஏசினா. |
| මල්ලිට කන්න කියන්න | தம்பியை சாப்பிடச் சொல்லுங்கோ. |
| අක්කට ගයන්න පුළුවන් | அக்காவாலை பாட முடியும் |
| මල්ලි ගෙදර ගියා | தம்பி வீட்டுக்குப் போனான். |
| මේසේ උඩ ටෙලිෆොන් එක තියෙනවා | மேசைக்கு மேலை ரெலிபோன் இருக்கு. |

## ලිංග භේදය සම්බන්ධව මතුවන ගැටලු කිහිපයක්

**වගුව 2:** ලිංග භේදය සම්බන්ධව මතුවන ගැටලු කිහිපයක් (ගෙයර්, 1999)


| | |
|---|---|
| බල්ලා ඉන්නවා | நாய் இருக்கு |
| පුටුව තියෙනවා | கதிரை இருக்கு |
| අම්මා ඉන්නවා. | அம்மா இருக்கிறா |
| අම්මා කනවා. | அம்மா சாப்பிடுறா |
| බල්ලා කනවා. | நாய் சாப்பிடுது |

## ලිංග භේදය




**රූපය 1.** ලිංග භේදය

## කාල භේදය සම්බන්ධව මතුවන ගැටලු කිහිපයක්




**රූපය 2.** කාල භේදය සම්බන්ධව මතුවන ගැටලු කිහිපයක්

අනතීත කාලය යටතේ වර්තමාන කාලය සහ අනාගත කාලය සඳහා එකම ප්‍රත්‍යානුබන්ධය භාවිත කෙරේ.

දෙමළ භාෂාවේ කාල භේදය වර්තමාන කාලය, අතීත කාලය හා අනාගත කාලය යනුවෙන් තෙවදෑරුම් වේ. ඒ සඳහා වෙන් වෙන් වශයෙන් කාලවාචී ප්‍රත්‍යය භාවිත කෙරේ.

| | | | | |
|---|---|---|---|---|
| භාෂණය | වර්තමාන කාලය | - මම අද ගමට යනවා. | | |
| | අනාගත කාලය | - මම හෙට ගමට යනවා. | } | අනතීත කාලය |
| | අතීත කාලය | - මම ඊයේ ගමට ගියා. | | අතීත කාලය |
| ලේඛනය | වර්තමාන කාලය | - මම අද ගමට යමි. | | |
| | අනාගත කාලය | - මම හෙට ගමට යමි | } | අනතීත කාලය |
| | අතීත කාලය | - මම ඊයේ ගියෙමි. | | අතීත කාලය |

**වගුව 3:** කාලවාචී ප්‍රත්‍යය භාවිතය

| | භාෂණ දෙමළ | ලේඛන දෙමළ |
|---|---|---|
| **වර්තමාන කාලය** | நான் இண்டைக்கு ஊருக்கு போறன் | நான் இன்று ஊருக்கு போகின்றேன்/ செல்கிறேன். |
| **අනාගත කාලය** | நான் நாளைக்கு ஊருக்கு போவன். | நான் நாளை ஊருக்கு போவேன்/ செல்வேன். |
| **අතීත කාලය** | நான் நேத்து ஊருக்கு போனன். | நான் நேற்று ஊருக்கு போனேன்/ சென்றேன். |

## අර්ථ පද්ධතිය සම්බන්ධව මතුවන ගැටලු කිහිපයක්

දෙමළ භාෂාවෙන් සෘණීකෘත පද (Borrowings) ලෙස සිංහල භාෂාවට ප්‍රවේශ වූ පද රාශියකි. මෙසේ ප්‍රවේශවීමේදී අර්ථ පරිණාමතා (Semantic Change) සිදුව ඇති බැවින් දෙවන බසක් ලෙස දෙමළ භාෂාව ඉගෙනගන්නා විද්‍යාර්ථීන්හට අර්ථය සම්බන්ධ ගැටලු මතුවේ (කරුණාතිලක, 2006).

**වගුව 4:** අර්ථ පද්ධතිය සම්බන්ධව මතුවන ගැටලු කිහිපයක්

| දෙමළ වචනය | සිංහල අර්ථය | දෙමළ අර්ථය |
|---|---|---|
| இடம் | ඉඩම | ස්ථානය |
| பணிவிடை | පණිවිඩය | උපස්ථානය/ සාත්තුව |
| தடை | දඩය | බාධාව |
| கட்டை | කපටි | කොට |
| வண்ணம் | වන්නම | වර්ණය |
| ஒட்டு | ඔට්ටුව | අලවනවා |
| அவசரம் | අවසරය | හදිස්සිය |
| பச்சை | පච්චය (පච්චවඩම් - රතු පාට) | කොළ |
| சக்கரவட்டம் | ආටෝප සාටෝප සහිත ගැහැනිය | මල්වෙඩි වර්ගයක් |
| நல்லமலை | උසස් කෙනෙක් පහත් ලෙස... | උස කන්ද |

## භාෂා ද්විරූපතා හේතුවෙන් මතුවන ගැටලු

භාෂා ද්විරූපතාව වශයෙන් මෙහිදී භාෂණය (Spoken) සහ ලේඛනය (Written) වශයෙන් භාෂා භාවිතයේ පවතින විෂමතා අවධානයට ලක්වේ.

දෙමළ භාෂාවේ පිණිසාර්ථ ක්‍රියා රූපය ඉතාමත් වැදගත් ක්‍රියාරූපයකි. එයට හේතුව නම් එය දෙමළ භාෂාවේ බොහෝ ක්‍රියාරූප සාධනයට බෙහෙවින්ම උපකාරී වීමයි. එකී ක්‍රියාරූප සාධනයට හැකියාව ඇති කරගැනීම භාෂා භාවිතයට බෙහෙවින් අවශ්‍ය වේ. එබැවින් මෙහිදී බලාපොරොත්තු වන්නේ එම ක්‍රියා රූප සාධනය සිද්ධ වන ආකාරය පැහැදිලි කිරීමයි. ඇතැම් ග්‍රන්ථවල ක්‍රියාපද වර්ගීකරණය කොට ඇත්තේ ප්‍රබල ක්‍රියා ඃඑරදබට ඪැරශ්‍ෆි*, දුබල ක්‍රියා ඃඋ්න ඪැරශ්‍ෆි* නමිනි. සිංහල මාතෘ භාෂකයා දෙවන බසක් ලෙස දෙමළ ඉගෙන ගැනීමේදී එම බෙදීම යම් ආකාරයක සංකීර්ණ කාරණයක් බවට පත්ව ඇත.

එමනිසා මෙහිදී ක්‍රියා මූලයේ රූපීය ලක්ෂණය පදනම් කරගෙන දෙවන භාෂාවක් ලෙස ලේඛන දෙමළ භාෂාව හැදෑරීම සඳහා ඉගැන්වීමේ ක්‍රමවේදය කෙසේ සකස් කළ යුතුද? යන්න විමර්ශනය කිරීම පර්යේෂණ ගැටලුවයි.

දෙවන බසක් ලෙස ලේඛන දෙමළ ඉගැන්වීමේදී දෙමළ ක්‍රියා පදය සම්බන්ධයෙන් මතුවන ගැටලු අවම කරගැනීමට නව ක්‍රමවේදයක් හඳුන්වාදෙමින් පහසුවෙන් දෙමළ ක්‍රියාමූලයේ අතීත කාල ක්‍රියා පද නිර්මාණය කරගැනීම.

## පර්යේෂණ ක්‍රම වේදය

මහාචාර්ය ඩබ්. එස්. කරුණාතිලක මහතා විසින් සම්පාදිත **දෙමළ සිංහල අකාරාදිය** (2016 - සිව්වන මුද්‍රණය) ආචාර්ය පී. ආර්. සුබ්‍රමනියම්ගේ ප්‍රධාන සංස්කාරකත්වයෙන් එළිදැක්වුණු க்ரியாவின் தற்காலத் தமிழ் அகராதி (தமிழ் - தமிழ் ஆங்கிலம் - Reprinted 1997 යන අකාරාදි ද්විත්වය ප්‍රාථමික මූලාශ්‍රය ලෙස මෙහිදී භාවිත කෙරේ.

දෙමළ ඉගැන්වීම සම්බන්ධයෙන් වර්තමානයේදී ලියැවී ඇති දෙමළ මාධ්‍යය ග්‍රන්ථයන්, ඉංග්‍රීසි මාධ්‍ය ග්‍රන්ථයන් හා සිංහල මාධ්‍යය ප්‍රාමාණික ග්‍රන්ථ පරිශීලනය කෙරේ. පර්යේෂකයා වසර කිහිපයක දෙවන බසක් ලෙස දෙමළ භාෂාව ඉගැන්වීමෙන් ලත් අද්දැකීම් මෙම පර්යේෂණය සඳහා උපයෝගී කර ගැනේ.

මෙහි විෂය ක්ෂේත්‍ර සීමාව ලෙස දෙමළ භාෂාවේ බහුල ලෙස භාවිත වන අහඹු ලෙස තෝරාගත් ක්‍රියා මූල 100ක් කෙරෙහි මෙහිදී මූලික අවධානය යොමු කරනු ලබන අතර එම ක්‍රියා මූලයන්හි,

අතීත කාල කෘදන්ත පදය මූලික කරගත් ව්‍යාකරණ රූප පිළිබඳව පමණක් අවධානය යොමු කරමින් මෙම පර්යේෂණය සිදුකෙරේ.

මෙම අධ්‍යයනය මගින් සිංහල මාතෘ භාෂකයා දෙමළ භාෂාව දෙවන බසක් ලෙස ඉගෙන ගැනීමේදී මුහුණපාන සංකීර්ණතාවන් හඳුනාගෙන මෙම පර්යේෂණයෙන් සොයාගනු ලබන ක්‍රමවේද භාවිත කිරීමෙන් වඩාත් ඵලදායි ලෙස භාෂාව ඉගෙනීමටත් එය ව්‍යවහාර කිරීමටත් අවස්ථාව උදාකර ගනු ඇත.

## සාකච්ඡාව

## තෝරාගත් ක්‍රියා පද සහ එහි වර්ගීකරණය

| | | |
|---|---|---|
| **වාක්‍ය හා ව්‍යාකරණ සම්බන්ධයෙන්** | | |
| භාෂණයේදී සහ ලේඛනයේදී ව්‍යාකරණය එකිනෙකට සම්පූර්ණ වශයෙන් වෙනස්වේ.<br>විභක්ති ප්‍රත්‍යයන් සහ ක්‍රියා වරනැඟීමේදී මෙම වෙනස පැහැදිලිව දක්නට ඇත. | | |
| ஆலை > ஆல் | அன் > ஏன் | |
| இலை > இல் | அம் > ஓம் | |
| **වාක් කෝෂය සම්බන්ධයෙන්** | | |
| **භාෂණ දෙමළ** | **ලේඛන දෙමළ** | **සිංහල අර්ථය** |

| | | |
|---|---|---|
| தங்கச்சி | தங்கை | නංගි |
| அங்கை | அங்கே | එහෙ |
| அப்பிடி | அப்படி | එහෙම |
| **සංඛ්‍යාවාචී නාම** | | |
| ஒண்டு | ஒன்று | එක |

**වගුව 5:** වාක්‍ය හා ව්‍යාකරණ සම්බන්ධයෙන්

අහඹු ලෙස තෝරාගත් ලේඛන දෙමළ භාෂාවෙහි එන ක්‍රියා මූල 100ක රූපීය ලක්‍ෂණ පදනම් කරගෙන මෙම ක්‍රියා මූල වර්ගීකරණය සිදු කර ඇත. ඒ අනුව,

ක්‍රමවත් ක්‍රියා මූල[1] I
ක්‍රමවත් ක්‍රියා මූල II
ක්‍රමවත් ක්‍රියා මූල III
අක්‍රමවත් ක්‍රියා මූල යනුවෙන් එම වර්ග සතර පෙන්වා දියහැකිය.

ඒ අනුව එම වර්ගීකරණය එසේ හඳුන්වාදීමට හේතුකාරණා අවධානයට ගැනෙන අතර, ඒ ඒ වර්ගීකරණයන්ට අදාළ වන පරිදි ක්‍රියා මූල 100ක් නිදර්ශන වශයෙන් මෙහිදී දක්වනු ලැබේ.

## ක්‍රමවත් ක්‍රියා මූල I

යම්කිසි ක්‍රියා මූලයක් අවසන්ව ඇත්තේ **இ** හා **ஐ** යන ස්වරවලින් නම්/ මූල හ්‍රස්වයක් සහිත உ අන්ත අකුරු දෙකේ ක්‍රියා මූලයක් නම්/ හ්‍රස්ව ස්වර සහිත உ අන්ත අකුරු සතරේ ක්‍රියා මූලයක් නම්/ දීර්ඝ ස්වරයකින් පසුව ඇති ர் අන්ත ක්‍රියා මූලයක් නම්/ අකුරු දෙකට වඩා වැඩි වූ அ අන්ත ක්‍රියා මූලයක් නම්/ මූල හ්‍රස්වයක් (කෙටි ස්වරයක්) සහිත அ අන්ත අකුරු දෙකේ ක්‍රියා මූලයක් නම් එවැනි ක්‍රියා මූල ක්‍රමවත් ක්‍රියා මූල I යටතට මෙහිදී ගැනේ.

- **இ හා ஐ යන ස්වරවලින් අවසන් වන ක්‍රියා මූල**

| | | |
|---|---|---|
| படி | (ப் + அ + ட் + **இ**) | ඉගෙනගන්නවා |
| குளி | (க் + உ + ள் + **இ** ) | නානවා |
| சந்தி | (ச் + அ + ந் + த் + **இ**) | මුණගැහෙනවා |
| வாசி | (வ் + ஆ + ச் + **இ**) | කියවනවා |
| சமை | (ச் + அ + ம் + **ஐ**) | උයනවා |
| நினை | (ந் + இ + ன் + **ஐ**) | සිතනවා |
| கதை | (க் + அ + த் + **ஐ**) | කතාකරනවා |
| கிடை | (க் + இ + ட் + **ஐ**) | ලැබෙනවා |

- **මූල හ්‍රස්වයක් සහිත உ අන්ත අකුරු දෙකේ ක්‍රියා මූල**

| | | |
|---|---|---|
| அறு | (அ + ற் + **உ**) | කඩනවා |
| படு | (ப் + அ + ட் + **உ**) | හාන්සිවෙනවා |
| தொடு | (த் + ஒ + ட் + **உ**) | සම්බන්ධ කරනවා |
| கொடு | (க் + ஒ + ட் + **உ**) | දෙනවා |

- **හ්‍රස්ව ස්වර සහිත உ අන්ත අකුරු සතරේ ක්‍රියා මූල**

[1] ක්‍රියා රූප සාධනයේදී ක්‍රමික බවින් යුක්ත ක්‍රියා පද ක්‍රමවත් යන්නෙන් මෙහිදී හඳුන්වා දෙනු ලබන අතර, අක්‍රමවත් යන්නෙන් එසේ ක්‍රමික බවින් තොරවූ ක්‍රියා පද හැඳින්වේ.

| | | |
|---|---|---|
| கடுகடு | (க் + அ + ட் + உ + க் + அ + ட் + உ) | නොපැහැදිලි ලෙස කතාකරනවා |
| கிசுகிசு | (க் + இ + ச் + உ + க் + இ + ச் + உ) | රහසින් කියනවා |
| சிடுசிடு | (ச் + இ + ட் + உ + ச் + இ + ட் + உ) | රවනවා |
| பிசுபிசு | (ப் + இ + ச் + உ + ப் + இ + ச் + உ) | ඇලෙනවා |

- **දීර්ඝ ස්වරයකින් පසුව ඇති ர් අන්ත ක්‍රියා මූල**

| | | |
|---|---|---|
| சேர் | (ச் + ஏ + ர்) | එකතුවෙනවා/ බැඳෙනවා |
| பார் | (ப் + ஆ + ர்) | බලනවා |
| ஈர் | (ஈ + ர்) | ආකර්ෂණය වෙනවා |
| வேர் | (வ் + ஏ + ர்) | දාඩිය දානවා |

- අකුරු දෙකට වඩා වූ அ අන්ත ක්‍රියා මූල

| | | |
|---|---|---|
| கரகர | (கரகர் + அ) | මිලකරනවා |
| சரசர | (சரசர் + அ) | සරසරගානවා |
| தளதள | (தளதள் + அ) | දිලිසෙනවා |
| படபட | (படபட் + அ) | ඉක්මන්වෙනවා |

- මුල හ්‍රස්වයක් (කෙටි ස්වරයක්) සහිත அ අන්ත අකුරු දෙකේ ක්‍රියා මූල

| | | |
|---|---|---|
| திற | (த் + இ + ற் + அ) | විවෘතකරනවා |
| மற | (ம் + அ + ற் + அ) | අමතක කරනවා |
| நட | (ந் + அ + ட் + அ) | ඇවිදිනවා |
| பற | (ப் + அ + ற் + அ) | ඉගිලෙනවා |

## ක්‍රමවත් ක්‍රියා මූල II

යම්කිසි ක්‍රියාමූලයක් **...இடு** සහ ...படு වලින් අවසන්ව ඇති තිබේ නම් එවැනි ක්‍රියා මූල ක්‍රමවත් ක්‍රියා පද - **ii** ලෙස මෙහිදී හැඳින්වේ.

- **ක්‍රියාමූලය ...இடு** සහ ...படு වලින් අවසන්ව ඇති ක්‍රියාපද

| | | |
|---|---|---|
| இடு | (**இடு**) | තබනවා |
| சாப்பிடு | (ச் + ஆ + ப்+ ப் + **இடு**) | කනවා |
| கூப்பிடு | (க் + ஊ + ப்+ ப் + **இடு**) | අඬගහනවා |
| வெளிக்கிடு | (வ் + எ + ள் + இ + க் + க் + **இடு**) | සූදානම්වෙනවා |
| முத்தமிடு | (ம் + உ + த் + த் + அ + ம் + **இடு**) | සිඹිනවා |
| அறவிடு | (அ + ற் + அ + வ் + **இடு**) | අයකරනවා |
| பங்கிடு | (ப் + அ + ங் + க் + **இடு**) | බෙදනවා |
| பயிரிடு | (ப் + அ + ய் + இ + ர் + **இடு**) | වගාකරනවා |
| சிறையிடு | (ச் + இ + ற் + ஐ + ய் + **இடு**) | සිරගත කරනවා |
| மதிப்பிடு | (ம் + அ + த் + இ + ப் + ப் + **இடு**) | තක්සේරුකරනවා |
| ஒப்பிடு | (ஒ + ப் + ப் + **இடு**) | සමානකරනවා |
| நிறையிடு | (ந் + இ + ற் + ஐ + ய் + **இடு**) | බරකිරනවා |
| அச்சிடு | (அ + ச் + ச் + **இடு**) | අච්චුගසනවා |
| போரிடு | (ப் + ஓ + ர் + **இடு**) | යුද්ධකරනවා |
| ஆணையிடு | (ஆ + ண் + ஐ + ய் + **இடு**) | අණදෙනවා/දිවුරනවා |
| ஆணைவிடு | (ஆ + ண் + ஐ + வ் + **இடு**) | පොරොන්දු කඩකරනවා |
| சண்டையிடு | (ச் + அ + ண் + ட் + ஐ + ய் + **இடு**) | ගහගන්නවා |
| கஷ்டப்படு | (க் + அ + ஷ் + ட் + அ + ப் + **படு**) | අමාරුවෙනවා |
| பயப்படு | (ப் + ய + ப் + **படு**) | බයවෙනවා |

| | | |
|---|---|---|
| குணப்படு | (க் + உ + ண் + அ + ப் + **படு**) | සුවවෙනවා |
| பாடுபடு | (ப் + ஆ + ட் + உ + **படு**) | මහන්සිවෙනවා |
| செயற்படு | (ச் + எ + ய் + அ + ற் + **படு**) | සිදුවෙනවා |
| வெட்கப்படு | (வ் + எ + ட் + க் + அ + ப் + **படு**) | ලැජ්ජාවෙනවා |
| தேவைப்படு | (த் + ஏ + வ் + ஐ + ப் + **படு**) | අවශ්‍යවෙනවා |
| அகப்படு | (அ + க் + அ + ப் + **படு**) | අඩංගුවෙනවා |
| அவசரப்படு | (அ + வ் + அ + ச் + அ + ர் + அ + ப் + **படு**) | ඉක්මන්වෙනවා |

## ක්‍රමවත් ක්‍රියා මූල III

- **உ** අන්ත ක්‍රියාපද (මුල හ්‍රස්වයක් සහිත உ අන්ත අකුරු දෙකේ ක්‍රියාපද හා ක්‍රමවත් අංක ii දී හමු වූ ක්‍රියා මූල හැර)

| | | |
|---|---|---|
| அனுப்பு | (அ + ன் + உ+ ப் + ப் + **உ**) | යවනවා |
| திரும்பு | (த் + இ + ர்+ உ + ம் + **உ**) | හැරෙනවා |
| காட்டு | (க் + ஆ + ட் + ட் + **உ**) | පෙන්වනවා |
| ஆடு | (ஆ + ட் + **உ**) | නටනවා |
| ஓடு | (ஓ + ட் + **உ**) | දුවනවා |
| தேடு | (த் + ஏ + ட் + **உ**) | සොයනවා |
| பாடு | (ப் + ஆ + ட் + **உ**) | ගයනවා |
| உதவு | (உ + த் + வ் + **உ**) | උදව් කරනවා |
| பழகு | (ப் + அ + ழ் + அ + க் + **உ**) | පුහුණු වෙනවා/ පුරුදු වෙනවා |
| கழுவு | (க் + அ + ழ் + உ + வ் + **உ**) | සෝදනවා |
| குழறு | (க் + உ + ழ் + அ + ற் + **உ**) | කෑගහනවා |
| வீசு | (வ் + ஈ + ச் + **உ**) | විසිකරනවා |
| தங்கு | (த் + அ + ங் + க் + **உ**) | නතර කරනවා/ නවතිනවා |
| பூட்டு | (ப் + ஊ + ட் + ட் + **உ**) | අගුල දානවා/පූට්ටු වෙනවා |
| பேசு | (ப் + ஏ + ச் + **உ**) | කථා කරනවා |
| மீறு | (ம் + ஈ + ற் + **உ**) | උල්ලංගණය කරනවා |
| எண்ணு | (எ + ண் + ண் + **உ**) | ගණන් කරනවා |
| தள்ளு | (த் + அ + ள் + ள் + **உ**) | තල්ලු කරනවා |
| ஊற்று | (ஊ + ற் + ற் + **உ**) | වක් කරනවා |
| தூக்கு | (த் + ஊ + க் + க் + **உ**) | ඔසවනවා |
| வாழ்த்து | (வ் + ஆ + ழ் + த் + த் + **உ**) | ආශීර්වාද කරනවා |
| ஏறு | (ஏ + ற் + **உ**) | නගිනවා |
| எழுது | (எ + ழ் + உ + த் + **உ**) | ලියනවා |
| முன்னேறு | (ம் + உ + ன் + ன் + ஏ + ற் + **உ**) | දියුණුවෙනවා |

## අක්‍රමවත් ක්‍රියා පද

- ඉහත ක්‍රම තුනටම අයත් නොවන ක්‍රියා පද

| | |
|---|---|
| வா | එනවා |
| போ | යනවා |
| தா | දෙනවා |
| இரு | ඉන්නවා |
| வில் | විකුණනවා |
| நில் | නැවතී ඉන්නවා |
| கேள் | අසනවා/ඉල්ලනවා |
| செய் | කරනවා |
| செல்(லு) | යනවා |

| | |
|---|---|
| சொல்(லு) | කියනවා |
| விழு | වැටෙනවා |
| அழு | අඬනවා |
| உழு | හානවා |
| நடு | සිටවනවා |
| சுடு | වෙඩි තියනවා |
| காண் | දකිනවා |
| தவழ் | බඩගානවා |
| இகழ் | නින්දා කරනවා |
| பிரள் | පෙරළෙනවා |
| தின்(னு) | කනවා |
| என்(னு) | කියනවා |
| ஆகு | වෙනවා |
| நோ | රිදෙනවා |
| சா | මැරෙනවා |

## අතීත කාල ක්‍රියාමූල සාධනය

දෙමළ භාෂාවෙහි අතීත කාලය හඟවන විභජක සර්ගද දැකගත හැකිය. த்த் /ந்த் /ட்ட் /இன் /ன்ற் / ந்த் /ன்ன் /ன் /ற்ற் /த் යනු එම අතීත කාලය හඟවන විභජක සර්ග කිහිපයකි. මෙහිදී ඒ ඒ වර්ගීකරණයට අදාළව අතීත කාල ක්‍රියාමූලය නිර්මාණය කරගන්නා අයුරු මෙහිදී විමසා බැලේ.

## ක්‍රමවත් ක්‍රියා මූල I

මෙම වර්ගීකරණයට අදාළ ක්‍රියාමූලයක අතීත කාල ක්‍රියාමූලය නිර්මාණය කරගැනීමේදී ක්‍රියාමූලයට த்து හා ந்து[2] යන විභජක සර්ගය එකතු කෙරේ.

**වගුව 6:** இ හා ஐ යන ස්වරවලින් අවසන් වන ක්‍රියා මූල

| இ හා ஐ යන ස්වරවලින් අවසන් වන ක්‍රියා මූල | | | |
|---|---|---|---|
| படி | த்த் | படித்த்- | ඉගෙනගති(මි) |
| குளி | | குளித்த்- | නැවෙ(මි) |
| சந்தி | | சந்தித்த்- | මුණගැසුණෙ(මි) |
| வாசி | | வாசித்த்- | කියෙව්වෙ(මි) |
| சமை | | சமைத்த்- | ඉව්වෙ(මි) |
| நினை | | நினைத்த்- | සිතුණෙ(මි) |
| கதை | | கதைத்த்- | කතාකළෙ(මි) |
| கிடை | | கிடைத்த்- | ලැබුණෙ(මි) |

**වගුව 7:** මුල හ්‍රස්වයක් සහිත உ අන්ත අකුරු දෙකේ ක්‍රියා මූල

| මුල හ්‍රස්වයක් සහිත உ අන්ත අකුරු දෙකේ ක්‍රියා මූල | | | |
|---|---|---|---|
| அறு | த்த் | அறுத்த்- | කැඩුණෙ(මි) |
| படு | | படுத்த்- | හාන්සිවුණෙ(මි) |
| தொடு | | தொடுத்த்- | සම්බන්ධ කළෙ(මි) |
| கொடு | | கொடுத்த்- | දුන්නෙ(මි) |

[2] අධ්‍යයන කාර්යාවලියෙහි පහසුව සලකා මෙහිදී த்து > த்த் කියාද ந்து > ந்த் කියාද භාවිත කෙරේ.

**වගුව 8:** හ්‍රස්ව ස්වර සහිත உ අන්ත අකුරු සතරේ ක්‍රියා මූල

| හ්‍රස්ව ස්වර සහිත உ අන්ත අකුරු සතරේ ක්‍රියා මූල | | | |
|---|---|---|---|
| கடுகடு | த்த் | கடுகடுத்த்- | නොපැහැදිලි ලෙස කතාකළෙ(මි) |
| கிசுகிசு | | கிசுகிசுத்த்- | රහසින් කියෙව්වෙ(මි) |
| சிடுசிடு | | சிடுசிடுத்த்- | රැව්වෙ(මි) |
| பிசுபிசு | | பிசுபிசுத்த்- | ඇලුණෙ(මි) |

**වගුව 9:** දීර්ඝ ස්වරයකින් පසුව ඇති ர் අන්ත ක්‍රියා මූල

| දීර්ඝ ස්වරයකින් පසුව ඇති ர் අන්ත ක්‍රියා මූල | | | |
|---|---|---|---|
| சேர் | த்த் | சேர்த்த்- | එකතුවුණෙ(මි)/ බැඳුණෙ(මි) |
| பார் | | பார்த்த்- | බැලුවෙ(මි) |
| ஈர் | | ஈர்த்த்- | ආකර්ෂණය වුණෙ(මි) |
| வேர் | | வேர்த்த்- | දාඩිය දැම්මෙ(මි) |

**වගුව 10:** අකුරු දෙකට වඩා වූ அ අන්ත ක්‍රියා මූල

| අකුරු දෙකට වඩා වූ அ අන්ත ක්‍රියා මූල | | | |
|---|---|---|---|
| கரகர | த்த் | கரகரத்த்- | මිලකළෙ(මි) |
| சரசர | | சரசரத்த்- | සරසරගෑවෙ(මි) |
| தளதள | | தளதளத்த்- | දිලිසුණෙ(මි) |
| படபட | | படபடத்த்- | ඉක්මන්වුණෙ(මි) |

**වගුව 11:** මූල හ්‍රස්වයක් (කෙටි ස්වරයක්) සහිත அ අන්ත අකුරු දෙකේ ක්‍රියා මූල

| මූල හ්‍රස්වයක් (කෙටි ස්වරයක්) සහිත அ අන්ත අකුරු දෙකේ ක්‍රියා මූල | | | |
|---|---|---|---|
| திற | ந்த் | திறந்த்- | විවෘතකළෙ(මි) |
| மற | | மறந்த்- | අමතක කළෙ(මි) |
| நட | | நடந்த்- | ඇවිද්දෙ(මි) |
| பற | | பறந்த்- | ඉගිලුණෙ(මි) |

## ක්‍රමවත් ක්‍රියා මූල II

මෙම වර්ගීකරණයට අදාළ ක්‍රියාමූලයක අතීත කාල ක්‍රියාමූලය නිර්මාණය කරගැනීමේදී ක්‍රියාමූලයෙහි අග ඇති டு වෙනුවට ட்டு[3]යන විභජක සර්ගය ආගමය කෙරේ.

**වගුව 12:** ක්‍රියාමූලය ...இடு සහ ...படு වලින් අවසන්ව ඇති ක්‍රියා මූල

| ක්‍රියාමූලය ...இடு සහ ...படு වලින් අවසන්ව ඇති ක්‍රියා මූල |
|---|

[3] අධ්‍යයන කාර්යාවලියෙහි පහසුව සලකා මෙහිදී ட்டு > ட்ட் කියා භාවිත කෙරේ.

| | | | |
|---|---|---|---|
| சாப்பிடு | | சாப்பிட்ட்- | කෑවෙ(මි) |
| கூப்பிடு | | கூப்பிட்ட்- | අඬගැසුවෙ(මි) |
| வெளிக்கிடு | | வெளிக்கிட்ட்- | සූදානම්වුණෙ(මි) |
| முத்தமிடு | | முத்தமிட்ட்- | සිම්බෙ(මි) |
| அறவிடு | | அறவிட்ட்- | අයකළෙ(මි) |
| பங்கிடு | | பங்கிட்ட்- | බෙදුවෙ(මි) |
| பயிரிடு | | பயிரிட்ட்- | වගාකළෙ(මි) |
| சிறையிடு | /டு ட்ட் | சிறையிட்ட்- | සිරගත කළෙ(මි) |
| மதிப்பிடு | | மதிப்பிட்ட்- | තක්සේරුකළෙ(මි) |
| ஒப்பிடு | | ஒப்பிட்ட்- | සමානකළෙ(මි) |
| நிறையிடு | | நிறையிட்ட்- | බරකිරුවෙ(මි) |
| அச்சிடு | | அச்சிட்ட்- | අච්චුගැසුවෙ(මි) |
| போரிடு | | போரிட்ட்- | යුද්ධකළෙ(මි) |
| ஆணையிடு | | ஆணையிட்ட்- | අණදුන්නෙ(මි)/දිවුරුවෙ(මි) |
| ஆணைவிடு | | ஆணைவிட்ட்- | පොරොන්දු කඩකළෙ(මි) |
| சண்டையிடு | | சண்டையிட்ட்- | ගහගත්තෙ(මි) |
| கஷ்டப்படு | | கஷ்டப்பட்ட்- | අමාරුවුණෙ(මි) |
| பயப்படு | | பயப்பட்ட்- | බයවුණෙ(මි) |
| குணப்படு | | குணப்பட்ட்- | සුවවුණෙ(මි) |
| பாடுபடு | | பாடுபட்ட்- | මහන්සිවුණෙ(මි) |
| செயற்படு | | செயற்பட்ட்- | සිදුවුණෙ(මි) |
| வெட்கப்படு | | வெட்கப்பட்ட்- | ලැජ්ජාවුණෙ(මි) |
| தேவைப்படு | | தேவைப்பட்ட்- | අවශ්‍යවුණෙ(මි) |
| அகப்படு | | அகப்பட்ட்- | අඩංගුවුණෙ(මි) |
| அவசரப்படு | | அவசரப்பட்ட்- | ඉක්මන්වුණෙ(මි) |

## ක්‍රමවත් ක්‍රියාමූල III

මෙම වර්ගීකරණයට අදාළ ක්‍රියාමූලයක අතීත කාල ක්‍රියාමූලය නිර්මාණය කරගැනීමේදී ක්‍රියාමූලයෙහි අග ඇති உ වෙනුවට இன் යන විභජක සර්ගය ආගමය කෙරේ.

**වගුව 13: உ අන්ත ක්‍රියාපද** (මුල හ්‍රස්වයක් සහිත **உ** අන්ත අකුරු දෙකේ ක්‍රියාපද හා ක්‍රමවත් අංක **ii** දී හමු වූ ක්‍රියා මූල හැර)

| | | | |
|---|---|---|---|
| **உ** අන්ත ක්‍රියාපද (මුල හ්‍රස්වයක් සහිත உ අන්ත අකුරු දෙකේ ක්‍රියාපද හා ක්‍රමවත් අංක ii දී හමු වූ ක්‍රියා මූල හැර) | | | |
| அனுப்பு | | அனுப்பின்- | යැව්වෙ(මි)<br>එව්වෙ(මි) |
| திரும்பு | | திரும்பின்- | හැරුණෙ(මි) |
| காட்டு | | காட்டின்- | පෙන්නුවෙ(මි) |
| ஆடு | | ஆடின்- | නැටුවෙ(මි) |
| ஓடு | | ஓடின்- | දිව්වෙ(මි) |
| தேடு | | தேடின்- | සෙව්වෙ(මි) |
| பாடு | | பாடின்- | ගැයුවෙ(මි) |
| உதவு | | உதவின்- | උදව් කළෙ(මි) |
| பழகு | / உ | பழகின்- | පුහුණු වුණෙ(මි)/<br>පුරුදු වුණෙ(මි) |

| | | | |
|---|---|---|---|
| கழுவு | இன் | கழுவின்- | සේදුවෙ(මි) |
| குழறு | | குழறின்- | කෑගැසුවෙ(මි) |
| வீசு | | வீசின்- | විසිකළෙ(මි) |
| தங்கு | | தங்கின்- | නතර කළෙ(මි)/ නැවතුණෙ(මි) |
| பூட்டு | | பூட்டின்- | අගුල දැමුවෙ(මි)/ පූට්ටු වුණෙ(මි) |
| பேசு | | பேசின்- | කථා කළෙ(මි) |
| மீறு | | மீறின்- | උල්ලංඝණය කළෙ(මි) |
| எண்ணு | | எண்ணின்- | ගණන් කළෙ(මි) |
| தள்ளு | | தள்ளின்- | තල්ලු කළෙ(මි) |
| ஊற்று | | ஊற்றின்- | වක් කළෙ(මි) |
| தூக்கு | | தூக்கின்- | එසෙව්වෙ(මි) |
| வாழ்த்து | | வாழ்த்தின்- | ආශීර්වාද කළෙ(මි) |
| ஏறு | | ஏறின்- | නැංගෙ(මි) |
| எழுது | | எழுதின்- | ලිව්වෙ(මි) |
| முன்னேறு | | முன்னேறின்- | දියුණුවුණෙ(මි) |

**අකර්මක ක්‍රියා මූල**

අකර්මක ක්‍රියා මූලයන්හි අතීත කාල ක්‍රියාමූලය මතකයේ තබාගැනීමට උපදෙස් දීම ඉගැන්වීමේ කාර්යය පහසු කෙරේ.

**වගුව 14:**

| த்த் /ந்த் /ட்ட் /இன் /ன்ற் / ந்த் /ன்ன் /ன் /ற்ற் /த் | | |
|---|---|---|
| வா/ வரு | வந்த்- | පැමිණියෙ(මි) |
| போ | போன்ன்- | ආවෙ(මි) |
| தா | தந்த்- | දුන්නෙ(මි) |
| விடு | விட்ட்- | හැරියෙ(මි) |
| இரு | இருந்த்- | සිටියෙ(මි) |
| வில் | விற்ற்- | විකුණුවෙ(මි) |
| நில் | நின்ற்- | නැවතී සිටියෙ(මි) |
| கேள் | கேட்ட்- | ඇසුවෙ(මි)/ඉල්ලුවෙ(මි) |
| செய் | செய்த்- | කළෙ(මි) |
| செல்(லு) | சென்ற்- | ගියෙ(මි) |
| சொல்(லு) | சொன்ன்- | කීවෙ(මි) |
| விழு | விழுந்த்- | වැටුණෙ(මි) |
| அழு | அழுத்- | අඬගැසුවෙ(මි) |
| உழு | உழுந்த்- | හැවෙ(මි) |
| நடு | நட்ட்- | සිටෙව්වෙ(මි) |

| சுடு | சுட்ட்- | වෙඩි තිබ්බෙ(මි) |
|---|---|---|
| காண் | கண்ட்- | දැක්කෙ(මි) |
| தவழ் | தவழ்ந்த்- | බඩගෑවෙ(මි) |
| இகழ் | இகழ்ந்த்- | නින්දා කළෙ(මි) |
| பிரள் | பிரண்ட்- | පෙරළුවෙ(මි) |
| தின்(னு) | தின்ற்- | කෑවෙ(මි) |
| என்(னு) | என்ற்- | කියෙව්වෙ(මි) |
| ஆகு | ஆகின்- | වුණෙ(මි) |
| நோ | நோகின்- | රිදුණෙ(මි) |
| சா | செத்த் | මැරුණෙ(මි) |

## නිගමනය

### ක්‍රියා මූලයක අන්තය හා වර්ගීකරණය හඳුනාගැනීම

සිංහල මාතෘ භාෂකයා දෙවන බසක් ලෙස දෙමළ බස හැදෑරීමේදී ක්‍රියා පදය සම්බන්ධයෙන් මතුවන ගැටලු, ප්‍රධාන වශයෙන් ක්‍රියා මූලයක ඒ ඒ ක්‍රියා ප්‍රවර්ගයන් නිර්මාණය කරගැනීමේදී ක්‍රියා මූලයේ රූපීය ලක්ෂණය කෙරෙහි මූලික අවධානය යොමු කිරීම අගනේය. ඒ අනුව ක්‍රියා මූලයේ අන්තය ස්වරාන්තද නැතහොත් හලන්තද යන කාරණය අවබෝධ කරගැනීමට සමත් විය යුතුය. යම් ක්‍රියා මූලයක් ස්වරාන්ත ලෙස හඳුනාගනු ලැබුවද පසුව එහි අවසානයෙහි ඇත්තේ කුමන ස්වරයක්ද යන වගද අවබෝධ කරගෙන ඒ ඒ ස්වරාන්ත අනුව වෙන්කොට හඳුනා ගැනීමේ ශක්‍යතාව පළමුව තිබිය යුතුය. උදාහරණ වශයෙන් ගත් කල படி /கதை /திற /எடு /சாப்பிடு /கவலைப்படு /ஓடு /பார் /செல் /வில் යන ක්‍රියා මූලයන් ස්වරාන්තද නැතහොත් හලන්තද යන්න හඳුනාගැනීමේ හැකියාව මෙහිදී වටී.

| | |
|---|---|
| படி | (ப் + அ + ட் + **இ**) |
| கதை | (க் + அ + த் + **ஐ**) |
| திற | (த் + இ + ற் + **அ**) |
| கவலைப்படு | (க் + அ + வ் + அ + ல் + ஐ + ப் + ப் + அ + ட் + உ |
| ஓடு | (ஓ + ட் + **உ**) |
| பார் | (ப் + <u>**ஆ + ர்**</u>) |
| செல் | (ச் + எ **+ ல்**) |
| வில் | (வ் + இ **+ ல்**) |

යන ක්‍රියා මූලයන් පිළිවෙළින් ස්වරාන්ත බවත් එහිදුදු ඉ කාරාන්ත, අ කාරාන්ත, උ කාරාන්ත සහ හලන්ත බවත් පැහැදිලිව අවබෝධ කරගත හැකි වනුයේ රූපීය ලක්ෂණය පදනම්කරගෙනය. පසුව එම ලක්ෂණය ප්‍රධානව වෙනත් කාරණා ඊට එක්කොට සාදාගැනීමට හැකියාව පවතී. **උ අන්තව අකුරු දෙකේ, උ අක්ෂරයට මුලින් කෙටි ස්වරයක් සහිත** යන්න එයට උදාහරණයකි. ඉන් අනතුරුව ඒ ඒ ක්‍රියා ප්‍රවර්ගයන් නිර්මාණය කරගැනීමේදී යෙදෙන ප්‍රත්‍යයන්හි සමානතා සලකා බලා, සමාන ලක්ෂණයන්ගෙන් සමන්විත වූ ක්‍රියා මූලයන් මෙහිදී වර්ගීකරණයකට ලක් කර ඇත. ඒ අනුව,

යම්කිසි ක්‍රියා මූලයක් අවසන්ව ඇත්තේ **இ** හා **ஐ** යන ස්වරවලින් නම්/ මුල හ්‍රස්වයක් සහිත **உ** අන්ත අකුරු දෙකේ ක්‍රියා මූලයක් නම්/ හ්‍රස්ව ස්වර සහිත உ අන්ත අකුරු සතරේ ක්‍රියා මූලයක් නම්/ දීර්ඝ ස්වරයකින් පසුව ඇති ர் අන්ත ක්‍රියා මූලයක් නම්/ අකුරු දෙකට වඩා වැඩි වූ அ අන්ත ක්‍රියා මූලයක් නම්/ මුල හ්‍රස්වයක් (කෙටි ස්වරයක්) සහිත அ අන්ත අකුරු දෙකේ ක්‍රියා මූලයක් නම් එවැනි ක්‍රියා මූල ක්‍රමවත් ක්‍රියා මූල I යටතට මෙහිදී ගත හැකිය.

යම්කිසි ක්‍රියාමූලයක් **...இடு** සහ **...படு** වලින් අවසන්ව ඇති තිබේ නම් එවැනි ක්‍රියා මූල ක්‍රමවත් ක්‍රියා පද - **II** ලෙස මෙහිදී හැඳින්වේ.

**உ** අන්ත ක්‍රියාපද (මූල හ්‍රස්වයක් සහිත உ අන්ත අකුරු දෙකේ ක්‍රියාපද හා ක්‍රමවත් අංක ii දී හමු වූ ක්‍රියා මූල හැර)

ලෙස මෙහිදී **ක්‍රියා මූලයක** යම් වර්ගීකරණයක් පෙන්වාදිය හැකිය. පෙන්වාදිය හඳුනාගත හැකිය. **ඉහත ක්‍රම තුනටම අයත් නොවන ක්‍රියා** මූල ලෙස වෙනදු වර්ගීකරණයක් පෙන්වා දෙනු ලබන අතර එය ක්‍රියා රූපයන් නිර්මාණය කරගැනීමේදී සිදුවන යම් යම් වෙනස්කම් සලකා සිදුකර ඇත. එය ශිෂ්‍යයා විසින් අනිවාර්යයෙන්ම මතකයේ රඳවාගත යුතුය යන්න මෙහිදී කිව යුතුය. යුක්තක්ය යන අවධාරණය කර ඇත.

## ක්‍රමවත් අංක Iහි අතීත කාල ක්‍රියා රූපය නිර්මාණය කරගැනීම

මෙම වර්ගීකරණයට අදාළ ක්‍රියාමූලයක අතීත කාල ක්‍රියාමූලය නිර්මාණය කරගැනීමේදී ක්‍රියාමූලයට த்து හා ந்து[4] යන විභජක සර්ගය එකතු කිරීමෙන් සාදාගත හැකිය. මෙහිදී அ අන්ත ක්‍රියා මූලයට ந்த் ප්‍රත්‍යය එකතු කරන අතර, සෙසු සියල්ලට த்த் ප්‍රත්‍යය එකතු කිරීමෙන් අතීත කාල ක්‍රියා මූලය නිර්මාණය කරගත හැකිය.

## ක්‍රමවත් අංක IIහි අතීත කාල ක්‍රියා රූපය නිර්මාණය කරගැනීම

මෙම වර්ගීකරණයට අදාළ ක්‍රියාමූලයක අතීත කාල ක්‍රියාමූලය නිර්මාණය කරගැනීමේදී ක්‍රියාමූලයෙහි අග ඇති டு වෙනුවට ட்டு[5]යන විභජක සර්ගය ආගමය කිරීමෙන් සාදාගත හැකිය.

## ක්‍රමවත් අංක IIIහි අතීත කාල ක්‍රියා රූපය නිර්මාණය කරගැනීම

මෙම වර්ගීකරණයට අදාළ ක්‍රියාමූලයක අතීත කාල ක්‍රියාමූලය නිර්මාණය කරගැනීමේදී ක්‍රියාමූලයෙහි අග ඇති உ වෙනුවට இன் යන විභජක සර්ගය ආගමය කිරීමෙන් සාදාගත හැකිය.

## අක්‍රමවත් ක්‍රියා මූලයන්හි අතීත කාල ක්‍රියා රූපය නිර්මාණය කරගැනීම

මෙහිදී අක්‍රමවත් ක්‍රියා මූලයන්හි අතීත කාල ක්‍රියාමූලය මතකයේ තබාගැනීම සෙසු කාල දෙකටම වඩා වැදගත් බව කිව යුතුය. එහෙත් අක්‍රමවත් ක්‍රියා මූලයන්හි පිණිසාර්ථයෙහි ස්වභාවය පදනම් කොටගෙන අනාගත කාලය හා වර්තමාන කාලය මෙන්ම අතීත කාල ක්‍රියා මූලය නිර්මාණය කරගත හැකි බව පර්යේෂකයාගේ නිගමනයයි.

මෙහිදී මෙම වර්ගීකරණයට අක්‍රමවත් යන වචනය එනයින් භාවිත කිරීමේ යම් ගැටලුවක් යමෙකුට ඇතිවීම ස්වාභාවිකය. මෙයට මෙම නාමය ව්‍යවහාර කරනුයේ හුදෙක් දෙමළ බසට ආධුනිකයන්ගේ පහසුව සලකාගෙනය. එමෙන්ම මෙකී නාමයත් සමඟ ආධුනිකයෙකුට මෙම වර්ගීකරණය සම්බන්ධයෙන් පෙර වර්ගීකරණයන්ට වඩා වැඩි අවධානයක් යොමුකරවීමේ අදහසින් භාවිත කරන බව සැලකිය යුතුය.

මෙහිදී අක්‍රමවත් ක්‍රියා මූලයන්හි වුවද පිණිසාර්ථ රූපය පිළිබඳව නිවැරදි අවබෝධය තුළින් කාලත්‍රය නිර්මාණය කරගැනීමේ අවස්ථාව තිබේ. එහෙත් ක්‍රියා මූල කිහිපයක පමණක් යම් වෙනස්කම් කිහිපයක් දක්නට ලැබේ. එම වෙනස්කම් කිහිපය කෙරෙහි පමණක් වැඩි අවධානයක් යොමුකර සෙස්ස පහසුවෙන් මතකයේ රඳවා ගත

[4] අධ්‍යයන කාර්යාවලියෙහි පහසුව සලකා මෙහිදී த்து > த்த் කියාද ந்து > ந்த் කියාද භාවිත කෙරේ.
[5] අධ්‍යයන කාර්යාවලියෙහි පහසුව සලකා මෙහිදී ட்டு > ட்ட் කියා භාවිත කෙරේ.

හැකි බව මෙහිදී කිවයුතුය. භාෂා භාවිතය සම්බන්ධයෙන් ඇති පළපුරුද්ද මෙම වර්ගීකරණය සම්බන්ධයෙන් බලපාන බවද කිවයුතුය.

## මූලාශ්‍ර නාමාවලිය


කරුණාතිලක, ඩබ්ලිව්. එස්.(2006), *භාෂා සමීක්ෂා*, කොළඹ 10, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ

කරුණාතිලක, ඩබ්ලිව්. එස්.(2015), *සිංහල භාෂා ව්‍යාකරණය*, ගුණසේන

ගෙයර්, ජේම්ස්. ඩබ්ලිව්. සුසින්දිරරාජා, එස්., කරුණාතිලක. ඩබ්. එස්., (1999), *ව්‍යවහාර දෙමළ භාෂා ප්‍රවේශය*, (නාගිත, කදුරුගමුවේ, (පරි:), කැලණිය, කැලණිය විශ්වවිද්‍යාලය

ධම්මවිමල හිමි, උඩගලදෙණියේ, (2017), *දෙමළ විභක්ති* (දෙවන සංස්කරණය), විද්‍යාලංකාර ප්‍රකාශන

පුංචිහේවා, එස්. ජී. (2011), *භාෂාව සහ මනුෂ්‍යත්වය*, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

කරුණාතිලක, ඩබ්ලිව්. එස්.(2006), *දෙමළ - සිංහල අකාරාදිය*, කොළඹ 10, ඇස්.ගොඩගේ සහෝදරයෝ

තිලකරත්න, මිණිවන්. පී, සහ ජිනසේන, බී. එන්. (1990), *දමිළ සාහිත්‍යය, විශ්ව සාහිත්‍යය*, සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව